සියලු ම හිමිකම් ඇවිරිණි/All Rights Reserved]

# ර/ෆර්ගසන් උසස් විද්‍යාලය
# R/Ferguson High School

## දෙවන වාර පරීක්ෂණය - 2024 - සැප්තැම්බර්

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade: 12 | විෂය Subject: රසායන විද්‍යාව | පත්‍රය Paper: I | කාලය Time: පැය 02 යි |

සැ.යු. :

* ආවර්තිතා වගුවක් සපයා ඇත.
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
* අංක 01 සිට 50 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4), (5) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න. සපයා ඇති පිළිතුරු ලියන පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාල පිළිතුරු අංකය ඇති කවය තුළ (x) ලකුණ යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| සාර්වත්‍ර වායු නියතය R | = | $8.314\ J\ K^{-1}\ mol^{-1}$ | ඇවගාඩ්‍රෝ නියතය $N_A$ | = | $6.022 \times 10^{23}\ mol^{-1}$ |
| ප්ලාන්ක්ගේ නියතය h | = | $6.626 \times 10^{-34}\ Js$ | ආලෝකයේ ප්‍රවේගය c | = | $3 \times 10^{8}\ ms^{-1}$ |

**01.** ඉලෙක්ට්‍රෝනය, නියුට්‍රෝනය, කැතෝඩ කිරණ, ඉලෙක්ට්‍රෝන ශක්ති මට්ටම්වල පැවතීම යන හතර සොයා ගැනීමේ ගෞරවය ලබාගත් විද්‍යාඥයින් පිළිවෙළින්,

(1) ස්ටෝනි, චැඩ්වික්, බෝර්, තොම්සන්
(2) රදර්ෆඩ්, චැඩ්වික්, ක්රූක්ස්, බෝර්
(3) මිලිකන්, චැඩ්වික්, බෝර්, තොම්සන්
(4) තොම්සන්, චැඩ්වික්, ක්රූක්ස්, බෝර්
(5) තොම්සන්, රදර්ෆඩ්, ක්රූක්ස්, බෝර්

**02.** විද්‍යුත් චුම්බක තරංග වර්ගය සහ එහි ප්‍රයෝජන වඩා නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) ක්ෂුද්‍ර තරංග, ඡායා රූප ශිල්පය
(2) අධෝරක්ත තරංග, විෂබීජ නැසීමට
(3) X කිරණ, ස්ඵටිකවල ව්‍යුහය නිර්ණය කිරීමට
(4) $\gamma$ කිරණ, දුරස්ථ පාලක සංඥා නිකුත් කිරීමට
(5) දෘශ්‍ය තරංග, පිළිකා මර්දනයට

**02.** ඉලෙක්ට්‍රෝනයක් විසින් දැක්විය හැකි යැයි සැලකිය හැකි ලක්ෂණය/ ලක්ෂණ වන්නේ,

(a) e/m අනුපාතය නියතයකි
(b) විවර්තන රටා හා නිරෝධන රටා දක්වයි
(c) චුම්බක ක්ෂේත්‍රයකදී දක්ෂිණ ධ්‍රැවය දෙසට ආකර්ෂණය වේ.

(1) (a) හා (b) පමණි
(2) (a), (b) හා (c) පමණි
(3) (a) පමණි
(4) (b) හා (c) පමණි
(5) (b) පමණි



CamScanner

**04.** මින් කුමන පරමාණුවෙහි දෙවන අයනීකරණ ශක්තිය ඉහළ ම වේද?

(1) Be (2) Li (3) B (4) C (5) Al

**05.** තරංග ආයාමය $2.212 \times 10^2$ nm වන විකිරණ කදම්බයක ශක්ති ප්‍රමාණය $4.5 \times 10^2$ kJ විය. එහි අන්තර්ගත ක්වොන්ටම් ප්‍රමාණය වන්නේ,

(1) $5 \times 10^{20}$ (2) $5 \times 10^{21}$ (3) $5 \times 10^{22}$

(4) දළ වශයෙන් $5 \times 10^{23}$ (5) හරියට ම $5 \times 10^{23}$

**06.** ඉලෙක්ට්‍රෝන හතරක n හා $l$ අගයන් පහත a, b, c හා d ලෙස නිරූපණය කර ඇත.

(a) $n = 3$ $l = 2$ (b) $n = 3$ $l = 1$

(c) $n = 4$ $l = 1$ (d) $n = 4$ $l = 0$

මෙම ඉලෙක්ට්‍රෝනවල ශක්තිය වැඩිවන අනුපිළිවෙළ වන්නේ,

(1) $a < b < c < d$ (2) $b < c < a < d$ (3) $c < d < b < a$

(4) $b < a < d < c$ (5) $b < d < a < c$

**07.** 0.02 ml $dm^{-3}$ $FeC_2O_4$ ද්‍රාවණ 30.0 $cm^3$ ක් සම්පූර්ණයෙන් ම ඔක්සිකරණය කිරීම සඳහා 0.05 mol $dm^{-3}$ වන ආම්ලික $KMnO_4$ ද්‍රාවණයකින් කොපමණ පරිමාවක් අවශ්‍ය වේද?

(1) 10.7 $cm^3$ (2) 7.2 $cm^3$ (3) 10.2 $cm^3$

(4) 7.5 $cm^3$ (5) 8.5 $cm^3$

**08.** පහත සඳහන් අණු අතරින් ද්විධ්‍රැව ඝූර්ණයක් පවතින්නේ කුමකට ද?

(1) $CO_2$ (2) $BF_3$ (3) $CF_4$ (4) $Cl_2$ (5) $SO_2$

**09.** නිර්ජලීය $Na_2CO_3$ හා $NaHCO_3$ වලින් සමන්විත මිශ්‍රණයක ස්කන්ධය 2.00 g වේ. මෙය සම්පූර්ණයෙන් ම තාප වියෝජනය කිරීමෙන් පසු ඉතිරි වන ශේෂයේ ස්කන්ධය 1.85 g විය. මිශ්‍රණයේ අඩංගු $NaHCO_3$ ස්කන්ධ ප්‍රතිශතය මින් කුමක්ද? (Na = 23, H = 1, O = 16, C = 12)

(1) 20.25% (2) 20% (3) 18% (4) 33% (5) 80%

$2NaHCO_{3(s)} \longrightarrow Na_2CO_{3(s)} + CO_{2(g)} + H_2O_{(g)}$

**10.** Be, C, Mg, Si, Cl යන මූලද්‍රව්‍යවල පළමු අයනීකරණ ශක්තිය වැඩිවන නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

(1) $Mg < Be < Si < C < Cl$ (2) $Mg < Si < Be < C < Cl$

(3) $Mg < Be < Si < Cl < C$ (4) $Mg < Be < Cl < Si < C$

(5) $Mg < Si < C < Be < Cl$



CamScanner

11. පහත විශේෂ අතුරින් රේඛීය හා සීසෝ හැඩැති විශේෂ යුගලය පිළිවෙළින් ඇත්තේ,

(1) CNCl හා $IBr_2^-$ (2) $ClF_2^-$ හා $XeOF_2$

(3) $ClO_2^+$ හා $IF_4^+$ (4) $SCN^-$ හා $IF_4^+$

(5) $I_3^-$ හා $NOF_3$

12. සම ඉලෙක්ට්‍රොනික කැටායන හා ඇනායන අන්තර්ගත වන්නේ පහත කවර සංයෝගයකද?

(1) $Na_2S$ (2) $MgCl_2$ (3) $CaCl_2$ (4) $SrI_2$ (5) KBr

13. $N_2$, $NH_3$, $NO_3^-$ යන ප්‍රභේදවල N පරමාණුව පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) සියලුම ප්‍රභේදවල N පරමාණුවේ ආරෝපණය 0 වේ.

(2) මුහුම්කරණය පිළිවෙළින් $sp^2$, sp, $sp^3$ වේ.

(3) ඔක්සිකරණ අංක පිළිවෙළින් 0, -3 හා +5 වේ

(4) විද්‍යුත් සෘණතාව ආරෝහණ පටිපාටිය $NO_3^- < N_2 < NH_3$

(5) $NH_3$ හි ඔක්සිකරණ අංකය 0 වේ.

14. මුහුදු ජලයේ බර අනුව මුළු ප්‍රතිශතය 3.5% වෙයි. එම ලවණ වලින් 0.3% $CaCO_3$ වෙයි. මුහුදු ජලයේ ස්කන්ධය 1.08 g $cm^{-3}$ වේ නම්, $CaCO_3$ සාන්ද්‍රණය mol $dm^{-3}$ වලින් නිවැරදිව ප්‍රකාශ වන්නේ,

(1) $1.05 \times 10^{-2}$ mol $dm^{-3}$ (2) $1.134 \times 10^{-3}$ mol $dm^{-3}$

(3) $1.08 \times 10^{-3}$ mol $dm^{-3}$ (4) $1.134 \times 10^{-5}$ mol $dm^{-3}$

(5) $1.134 \times 10^{-4}$ mol $dm^{-3}$

15. 27°C දී $X_2$ නම් වායුවකින් 2 mol ක් බඳුනක් තුළ P නම් පීඩනයේ තබා ඇත. එමම භාජනයට එම වායුවෙන් ම තවත් 1 mol ක් ඇතුල් කළ විට පීඩනය ආරම්භක අගයෙන් දෙගුණයක් වූ අතර පරිමාව ද ආරම්භක පරිමාව මෙන් දෙගුණයක් විය. බඳුනේ උෂ්ණත්වය ද වෙනස් වූයේ නම්, $X_2$ වායුව පරිපූර්ණ වායුවක් ලෙස සැලකූ විට නව උෂ්ණත්වය වනුයේ,

(1) 800°C (2) 1200°C (3) 400°C (4) 127°C (5) 527°C

16. 0.4 mol $dm^{-3}$ $BaCl_2$ 200 $cm^3$ හා 0.2 mol $dm^{-3}$ NaCl 300 $cm^3$ මිශ්‍ර කර සාදා ගන්නා ලද ද්‍රාවණයක අඩංගු $Cl^-$ අයන සාන්ද්‍රණය වන්නේ mol $dm^{-3}$,

(1) 0.12 (2) 0.18 (3) 0.44 (4) 0.65 (5) 0.87



CamScanner

17. $NH_3$, $NO_2F$, $NO_4^{3-}$ යන ප්‍රභේද වලදී N හි විද්‍යුත් සෘණතාව අඩුවන ආකාරය නිවැරදිව දක්වා ඇත්තේ කුමකද?

(1) $NH_3 > NO_2F > NO_4^{3-}$ (2) $NO_2F > NO_4^{3-} > NH_3$

(3) $NO_4^{3-} > NH_3 > NO_2F$ (4) $NO_2F > NH_3 > NO_4^{3-}$

(5) $NH_3 > NO_4^{3-} > NO_2F$

18. $2MnO_4^- + 5H_2O_2 + 6H^+ \rightarrow 2Mn^{2+} + 5O_2 + 8H_2O$

ප්‍රතික්‍රියාව පිළිබඳ සත්‍ය වගන්තිය කුමක්ද?

(1) $H_2O_2$ වල O පරමාණුවේ ඔක්සිකරණ අංකය -2 සිට 0 දක්වා වැඩිවේ.

(2) $H_2O_2$ ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි

(3) $H_2O_2$ වල H පරමාණු ඔක්සිකරණය වේ

(4) $H_2O_2$ ඔක්සිකරණයට මෙන් ම ඔක්සිහරණයට ද භාජනය වේ

(5) $H_2O_2$ ඔක්සිහාරකයක් ලෙස ක්‍රියා කරයි

19. M නැමැති d ගොනුවට අයත් මූලද්‍රව්‍යයට අදාළ $M^{4+}$ අයනයේ වියුග්ම ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව 3 කි. වායුමය M පරමාණුවක අඩංගු වියුග්ම ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව වනුයේ,

(1) 2 (2) 3 (3) 4 (4) 5 (5) 6

20. පහත දී ඇති අණුවල බන්ධන කෝණ වැඩිවන නිවැරදි අනුපිළිවෙළ වනුයේ,

(1) $H_2O < H_2S < NH_3 < NCl_3 < CH_4$ (2) $H_2O < H_2S < NH_3 < CH_4 < NCl_3$

(3) $H_2S < H_2O < NCl_3 < NH_3 < CH_4$ (4) $NH_3 < H_2O < H_2S < CH_4 < NCl_3$

(5) $H_2S < H_2O < NH_3 < NCl_3 < CH_4$

21. ${}^{9}_{4}Be + \alpha \rightarrow X + {}^{1}_{0}n$

${}^{9}_{4}Be$ පරමාණුවක් α අංශුවක් සමග අන්තර්ක්‍රියා කළ විට X නැමැති පරමාණුවක් සහ නියුට්‍රෝනයක් සාදයි. X සම්බන්ධයෙන් සත්‍ය වනුයේ,

(1) X හි පරමාණුක ක්‍රමාංකය 5 (2) X හි ස්කන්ධ ක්‍රමාංකය 13

(3) X හි නියුට්‍රෝන 06 කි (4) X බෝරෝන් හි සමස්ථානිකයකි

(5) X බෙරිලියම්වල වෙනත් සමස්ථානිකයකි

22. $CuSO_4 \cdot 5H_2O$ 2.495 g ක් ජලය 100 $cm^3$ ක දියකර සාදා ගන්නා ද්‍රාවණයක $Cu^{2+}$ අයන සාන්ද්‍රණය ppm වලින්, (H = 1, O = 16, S = 32, Cu = 63.5)

(1) 249 (2) 635 (3) 1590 (4) 2490 (5) 6350



CamScanner

23. පහත දැක්වෙන කුමන ප්‍රභේදයෙහි අයනික, සහසංයුජ හා දායක බන්ධන යන තුන් වර්ගයම පවතීද?

(1) $H_2O$ (2) $NH_3$ (3) $NH_4Cl$ (4) $KBr$ (5) $H_3O^+$

24. Cu මූලද්‍රව්‍යයේ භූමි අවස්ථාවේ පවතින පරමාණුවක ඇති යුග්ම නොවූ ඉලෙක්ට්‍රෝන සඳහා යෙදෙන ක්වොන්ටම් අංක කුලකය n, $l$, $m_l$ හා $m_s$ වනුයේ,

(1) 3, 1, +1, +½ (2) 3, 2, 2, +½ (3) 4, 0, 0, +½

(4) 4, 2, +1, +½ (5) 4, 2, 0, +½

25. කාබනික සංයෝගයක C, H හා O පමණක් ඇති අතර ඒවායේ ස්කන්ධ ප්‍රතිශත පිළිවෙළින් 70.58, 5.89 හා 23.53 වේ. මෙම සංයෝගයේ ආනුභවික සූත්‍රය වන්නේ,

(1) $C_3H_5O$ (2) $C_6H_{10}O_2$ (3) $C_4H_4O$ (4) $C_4H_5O$ (5) $C_8H_8O_2$

26. M නම් මූලද්‍රව්‍යයක සල්ෆයිඩයක සූත්‍රය $M_2S_3$ වේ. එහි S ස්කන්ධ ප්‍රතිශතය 46% නම් M හි සාපේක්ෂ පරමාණුක ස්කන්ධය විය හැක්කේ,

(1) 56 (2) 54 (3) 44 (4) 25 (5) 41

27. ආම්ලික මාධ්‍යයේ $K_2Cr_2O_7(s)$ 5.88 g ක් වැඩිපුර KI ද්‍රාවණයක් සමග සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කරවන ලදී. මෙම ප්‍රතික්‍රියාවේදී පිටවූ $I_2$ සමග සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීමට අවශ්‍ය වන 0.5 mol $dm^{-3}$ $Na_2S_2O_3$ ද්‍රාවණ පරිමාව වනුයේ,

(K = 39, Cr = 52, O = 16)

$Cr_2O_7^{2-} \rightarrow Cr^{3+}$

$I^- \rightarrow I_2$

$S_2O_3^{2-} + I_2 \rightarrow S_4O_6^{2-} + I^-$

(1) 24 $cm^3$ (2) 120 $cm^3$ (3) 60 $cm^3$ (4) 134 $cm^3$ (5) 240 $cm^3$

28. පහත මූලද්‍රව්‍ය අතුරින් ඉහළ ම තුන්වන අයනීකරණ ශක්තිය සහිත මූලද්‍රව්‍ය කුමක්ද?

(1) B (2) N (3) O (4) Ne (5) Na

29. පහත කුමක් රේඛීය අණුවක් වන්නේද?

(1) $H_2O$ (2) H – CN (3) $SO_2$ (4) $C_2H_4$ (5) $Cl_2O$

30. නයිට්‍රස් ඔක්සයිඩ් ($N_2O$) වායුව තාප වියෝජනයෙන් $N_2$ හා $O_2$ වායුව සාදයි. යම් අවස්ථාවකදී $N_2$ වායුව ආරම්භක වායුවේ ප්‍රමාණයෙන් 64% ක් සෑදී ඇත. වායු පද්ධතියේ $O_2$ හි මවුල භාගය කොපමණද?

(1) 0.24 (2) 0.36 (3) 0.64 (4) 0.32 (5) 1.36

**උපදෙස් :**

එක් එක් ප්‍රශ්නයේ දක්වා ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර 4 අතුරෙන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර කවරේ දැයි තෝරා ගන්න.

(a) සහ (b) පමණක් නිවැරදි නම් (1) මත ද  (b) සහ (c) පමණක් නිවැරදි නම් (2) මත ද

(c) සහ (d) පමණක් නිවැරදි නම් (3) මත ද  (d) සහ (a) පමණක් නිවැරදි නම් (4) මත ද

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද උත්තර පත්‍රයෙහි දක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (a) සහ (b) පමණක් නිවැරදිය | (b) සහ (c) පමණක් නිවැරදිය | (c) සහ (d) පමණක් නිවැරදිය | (d) සහ (a) පමණක් නිවැරදිය | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය |

31. CO සමග සම ඉලෙක්ට්‍රෝනික වන්නේ පහත අයන අතරින් කුමන එකද/ ඒවාද?

(a) $O_2^{2-}$  (b) $CN^-$  (c) $O_2^-$  (d) $NO_2^+$

32.  සලකන්න.

(a) මෙම අණුවේ සියලුම C පරමාණු එකම තලයක පිහිටා ඇත

(b) මෙම අණුවේ සියලුම C – H බන්ධන දිගින් එක සමාන වේ

(c) C – C බන්ධන දිග s < q < p < r ලෙස වැඩිවේ

(d) මෙම අණුවේ C පරමාණු 3 ක් සරල රේඛීයව පිහිටා ඇත

33. ජලය සමග H බන්ධන ඇති කරගත හැක්කේ මින් කුමන සංයෝගවලටද?

(a) HCHO  (b) $C_6H_5-OH$  (c) $CH_3-Cl$  (d) $CH_3-O-CH_3$

34. පහත සඳහන් ප්‍රකාශ වලින් කුමක්/ කුමන ඒවා සත්‍ය වේද?

(a) Mg වල පළමු අයනීකරණ ශක්තිය Al වල පළමු අයනීකරණ ශක්තියට වඩා ඉහළය

(b) ලෝහ ධන අයනවල අයනික අරය අදාළ පරමාණුවේ අරයට වඩා කුඩාය

(c) $Ca^{2+}$ අයනයේ අරය $K^+$ අයනයේ අරයට වඩා විශාලය

(d) O වල පළමු අයනීකරණ ශක්තිය N වල පළමු අයනීකරණ ශක්තියට වඩා ඉහළ අගයක් ගනී.



CamScanner

35. මෙම අණු අතරින් ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය හා අණුවේ හැඩය එකම වන අණුව/ අණු කවරේද?

(a) $PF_3$ (b) $BF_3$ (c) $CF_4$ (d) $SF_4$

36. පරිපූර්ණ ලෙස හැසිරෙන වායුවක යම් පරිමාවක පීඩනය රඳා පවතින්නේ පහත කවරක්/ කවර ඒවා මතද?

(a) වායුවේ ස්කන්ධය
(b) වායුවේ උෂ්ණත්වය
(c) වායුවේ අණුවක ඇති පරමාණු සංඛ්‍යාව
(d) වායුවේ සාපේක්ෂ අණුක ස්කන්ධය

37. $N_2O$ අණුවේ ස්ථායි ලුවිස් ව්‍යුහය සම්බන්ධයෙන් කුමන ප්‍රකාශය සත්‍ය වේද?

(a) මධ්‍ය පරමාණුවේ මුහුම්කරණය sp වේ.
(b) අණුවේ හැඩය කෝණික වේ
(c) N පරමාණුවේ අෂ්ටකය අසම්පූර්ණ වේ
(d) N පරමාණු දෙකෙහි විද්‍යුත් සෘණතා අසමාන වේ.

38. ඔක්සිකරණ අංක සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ කුමන ප්‍රකාශය/ ප්‍රකාශනද?

(a) සංයෝගයක F පෙන්වන්නේ -1 ඔක්සිකරණ අංක පමණි
(b) O වැඩිපුර පෙන්වන්නේ -2 ඔක්සිකරණ අංකය පමණි
(c) සංයෝගයකදී පළමු කාණ්ඩයේ ලෝහවල ඔක්සිකරණ අංකය +1 වේ.
(d) සංයෝගයකදී යම් පරමාණුවක ඔක්සිකරණ අංකය 0 විය නොහැකිය.

39. පහත ප්‍රස්තාර සලකන්න. ඒ අතුරින් බොයිල් නියමය නිරූපණය වන ඒවා තෝරන්න.

(a)




(b)




(c)




(d)



40. හයිඩ්‍රජන් වර්ණාවලිය සම්බන්ධයෙන් සත්‍ය වගන්තිය/ වගන්ති වන්නේ,

(a) සංඛ්‍යාතය අනුව පෙළ ගැසූ වර්ණාවලියේ පුළුල් ම රේඛා ශ්‍රේණිය UV කලාපයේ ඇත

(b) දීප්තිමත් රේඛාව ලයිමාන් ශ්‍රේණියේ සංඛ්‍යාතය වැඩිම රේඛාවයි

(c) වර්ණාවලියේ එක් රේඛාවක සංඛ්‍යාතය එම ඉලෙක්ට්‍රෝනය අඩංගු ශක්ති මට්ටමේ ශක්තියට අනුලෝමව සමානුපාතික වේ.

(d) ඕනෑම ශ්‍රේණියක සංඛ්‍යාතය වැඩිවන දිශාවට රේඛා අතර පරතරය ද තීව්‍රතාවය ද අඩුවේ.

**උපදෙස් :**

එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවේ දැක්වෙන පරිදි (1) (2) (3) (4) හා (5) යන ප්‍රතිචාරවලින් කවර. ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍යය | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි |
| (2) | සත්‍යය | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි |
| (3) | සත්‍යය | අසත්‍යය |
| (4) | අසත්‍යය | සත්‍යය |
| (5) | අසත්‍යය | අසත්‍යය |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 41. | චුම්බක ක්ෂේත්‍රයකදී ධන කිරණ වක්‍රාකාර පථයක ගමන් කරයි | සියලු උප පරමාණුක අංශු චුම්බක ක්ෂේත්‍රයකදී වක්‍රාකාර පථවල ගමන් කරයි. |
| 42. | $SF_4$ ධ්‍රැවීය අණුවකි | අසමමිතික අණුවකට සෑම විටම ද්විධ්‍රැව ඝූර්ණයක් පවතී. |
| 43. | $HSO_3^-$ හි S – O බන්ධන දිග එකිනෙකට සමාන වේ. | $HSO_3^-$ සඳහා සම්ප්‍රයුක්ති ව්‍යුහ 3 ක් පවතී. |
| 44. | හයිඩ්‍රජන් විමෝචන වර්ණාවලියේ බාමර් ශ්‍රේණියේ සියලු විමෝචන රේඛාවල සංඛ්‍යාත දෘශ්‍ය කලාපයට අයත් වේ. | බාමර් ශ්‍රේණියේ සියලු ඉලෙක්ට්‍රෝන සංක්‍රමණවලදී ඉලෙක්ට්‍රෝන දෙවන ශක්ති මට්ටමට පැමිණේ. |
| 45. | අයිස්වල ඝනත්වය ද්‍රව ජලයේ ඝනත්වයට වඩා අඩුය | ද්‍රව ජලයේ පවතිනවාට වඩා ශක්තිමත් ආකාරයට H බන්ධන අයිස්වල සැකසී ඇත |
| 46. | $SiO_2$ හි ද්‍රවාංකය අධික වේ. | Si හා O අතර ශක්තිමත් බන්ධනවලින් සෑදෙන දැලිසක් පවතී. |



CamScanner

| | | |
|---|---|---|
| 47. | $C_2H_4$ වල පරමාණු දෙකම $sp^2$ මුහුම්කරණය වී පවතී. | ද්විත්ව බන්ධනයක් සහිත මධ්‍ය පරමාණු සෑම විටම $sp^2$ මුහුම්කරණය වී පවතී. |
| 48. | නියත උෂ්ණත්වයේදී ස්ථිර වායු ප්‍රමාණයක පීඩනය වායුවේ පරිමාවට අනුලෝමව සමානුපාතික වේ. | නියත උෂ්ණත්වයේදී වායුවේ පීඩනය අඩක් වන විට පරිමාව දෙගුණයක් වේ. |
| 49. | ප්‍රාථමික සම්මතයක් මගින් ප්‍රාමාණික ද්‍රාවණයක් පිළියෙළ කරගත හැක. | ප්‍රාථමික සම්මතයක සංයුතිය වායුගෝලය තුළ ගබඩාකර තිබීමේදී වෙනස් නොවේ. |
| 50. | $\alpha, \beta, \gamma$ කිරණ විනිවිද යාමේ බලයක් හා අයනීකාරක බලයක් ඇත. | $\alpha, \beta, \gamma$ කිරණ විද්‍යුත් චුම්බක විකිරණ විශේෂ වේ. |

## ආවර්තිතා වගුව/ஆவர்த்தன அட்டவணை/The Periodic Table

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | La-Lu | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | Ac-Lr | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Ds | 111 Rg | 112 Cn | 113 Nh | 114 Fl | 115 Mc | 116 Lv | 117 Ts | 118 Og |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57 La | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| 89 Ac | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |

සැකසුම

**රසායන විද්‍යා අංශය**

**ර/ෆර්ගසන් උසස් විද්‍යාලය**

* * * *

සියලු ම හිමිකම් ඇවිරිණි/All Rights Reserved]

**ර/ෆර්ගසන් උසස් විද්‍යාලය**
**R/Ferguson High School**

**දෙවන වාර පරීක්ෂණය - 2024 සැප්තැම්බර්**

| ශ්‍රේණිය Grade 12 | විෂය Subject රසායනික විද්‍යාව | පත්‍රය Paper II | කාලය Time |
|---|---|---|---|

**(B) කොටස - රචනා**

$(g = 10\ ms^{-2})$

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ k^{-1} mol^{-1}$

ඇවගාඩ්‍රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$

✱ **ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.**

05. (a) (i) දී ඇති ව්‍යුහය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



I) P, $C^1$, N හා $C^2$ යන පරමාණුවල මුහුම්කරණ හා ඔක්සිකරණ අංක සඳහන් කරන්න.

II) ඉහත ව්‍යුහයේ නයිට්‍රජන් පරමාණුව බන්ධන සෑදීමේදී කාක්ෂික, අතිච්ඡාදනය වන ආකාරය කාක්ෂික රූප සටහනක් මගින් නිරූපණය කර කාක්ෂික නම් කරන්න.

(ii) A හා B (නිවැරදි සංකේත නොවේ.) යනු දෙවන ආවර්තයේ අනුයාත නොවන මූලද්‍රව්‍ය දෙකකි. A මූලද්‍රව්‍ය හයිඩ්‍රජන් සමඟ $AH_3$ හා $AH_4^+$ යන ප්‍රභේද දෙක සාදයි. B මූලද්‍රව්‍ය හයිඩ්‍රජන් සමඟ $BH_3$ හා $BH_4^-$ යන ප්‍රභේද දෙක සාදයි.

I) A හා B යන මූලද්‍රව්‍ය සඳහා ඒවායේ නිවැරදි සංකේත ලියන්න.

II) $AH_3$ හා $AH_4^+$ යන ප්‍රභේදවල හැඩ අපෝහනය කරන්න.

III) $BH_3$ හා $BH_4^-$ යන ප්‍රභේදවල හැඩ අපෝහනය කරන්න.

(iii) $BH_3$ හා $AH_3$ හි ධ්‍රැවීය හා නිර්ධ්‍රැවීය බව සඳහන් කරන්න.

(iv) $BH_4^+$ හා $AH_4^-$ විශේෂ වල පවතින විශේෂිත ප්‍රාථමික අන්තර් ක්‍රියාව නම් කරන්න.

(b) (i) විදි ලාම්පුවකින් නිකුත් වන විකිරණයක තරංග ආයාමය 580 nm වේ.

I) මෙම විකිරණයෙන් නිකුත් වන ෆෝටෝන මවුලයක ශක්තිය ගණනය කරන්න.

II) මෙම ලාම්පුවෙන් තත්පර 10 කදී 800 J ක ශක්තියක් නිපදවේ නම්, තත්පරයක දී නිකුත් වන ෆෝටෝන ගණන කොපමණද?

III) ෆෝටෝන $1 \times 10^{20}$ ක් නිකුත් වීමට ගතවන කාලය සොයන්න.

(ii) I) විද්‍යුත් චුම්බක විකිරණ වර්ග 4 ක නම් ලියා එම විද්‍යුත් චුම්බක විකිරණ වල ප්‍රයෝජන එකක් බැගින් ලියන්න.

II) ඔබ ඉහත (I) හි දැක් වූ විද්‍යුත් චුම්බක විකිරණ වර්ග 4 ඒවායේ ශක්තිය වැඩිවන පිළිවෙළට සකසන්න.

06. (a) (i) අණුක සූත්‍රය හා ආනුභවික සූත්‍රය යන්න වෙන වෙනම හඳුන්වන්න.

(ii) ආනුභවික සූත්‍රය $C_2H_4O$ වන සංයෝගයක සාපේක්ෂ අණුක ස්කන්ධය 88 කි. එහි අණුක සූත්‍රය සොයන්න.

(iii) එක් එක් මූලද්‍රව්‍යයේ ස්කන්ධ ප්‍රතිශතය සොයන්න.

(iv) ආවර්තිතා වගුවේ 2 වැනි කාණ්ඩයට අයත් X නැමැති මූලද්‍රව්‍යයකින් සෑදෙන හයිඩ්‍රොක්සයිඩයක් $X(OH)_2.nH_2O$ ලෙස සජල ස්වරූපයෙන් පවතී. මෙහි 1.00 g ක් රත් කර නිර්ජල හයිඩ්‍රොක්සයිඩය බවට පත් කළ විට ජලය 0.542 g ක් නිදහස් වේ. මෙම ඵලය තවදුරටත් නියත ස්කන්ධයක් ලැබෙන තුරු රත් කළ විට ස්කන්ධය තවත් 0.068 g කින් අඩුවිය. n හි අගය සහ X වල සාපේක්ෂ පරමාණුක ස්කන්ධය සොයන්න.

සැ.යු. : $X(OH)_2(s) \longrightarrow XO(s) + H_2O(l)$

(b) පහත ප්‍රතික්‍රියා සම්පූර්ණ කර තුලිත කරන්න.

(i) $NaOH + H_2SO_4 \longrightarrow$

(ii) $N_2 + H_2 \longrightarrow$

(iii) ආම්ලික මාධ්‍යයේදී $K_2Cr_2O_7$ මගින් $H_2C_2O_4$ (ඔක්සලික් අම්ලය) $CO_2$ බවට ඔක්සිකරණය වීම.

$C_2O_4^{-2} \longrightarrow CO_2$

$Cr_2O_7^{2-} \longrightarrow Cr^{3+}$

(iv) $^{226}_{88}Ra \longrightarrow {}^{\cdots\cdots}_{86}Ra + {}^{4}_{\cdots\cdots}He$

(c) නිර්ජලීය $Na_2CO_3$ හා NaCl මිශ්‍රණයකින් 1.2 g ක් ආසුත ජලයේ දිය කර ද්‍රාවණ 250 $cm^3$ ක් පිළියෙළ කර ගන්නා ලදී. දර්ශකය ලෙස මෙතිල් ඔරේන්ජ් ඇති විට මෙම ද්‍රාවණයේ 25.0 $cm^3$ ක් සමග ප්‍රතික්‍රියා වීමට 0.1 mol $dm^{-3}$ HCl ද්‍රාවණයකින් 20.0 $cm^3$ ක් වැය විය. මිශ්‍රණයේ තිබූ NaCl ප්‍රතිශතය සොයන්න. (Na = 23, Cl = 35.5)

(සැ.යු. : ද්‍රාවණ 25.0 $cm^3$ ක් තුළ වූ $Na_2CO_3$ හා NaCl වලින් HCl සමග ප්‍රතික්‍රියා වනුයේ $Na_2CO_3$ පමණි.)

සැ.යු. : $Na_2CO_3 + 2HCl \longrightarrow 2NaCl + CO_2 + H_2O$



CamScanner

07. (a) (i) ඝන $K_2CO_3$ කිසියම් ස්කන්ධයක් ජලයේ දියකර ද්‍රාවණ 100 $cm^3$ ක් පිළියෙළ කරගනී. මේ ද්‍රාවණයෙන් 10.0 $cm^3$ වෙන් කර ජලයෙන් තනුක කිරීම මගින් ද්‍රාවණ 500 $cm^3$ ක් පිළියෙළ කර ගනී. එම ද්‍රාවණයෙන් 25 $cm^3$ ක් සමග මුළුමනින් ම ප්‍රතික්‍රියා වීමට 0.05 $mol\ dm^{-3}$ HCl ද්‍රාවණයකින් 16 $cm^3$ ක් වැය විය. මුලින් ගත් $K_2CO_3$ ස්කන්ධය සොයන්න.

(සැ.යු. : $K_2CO_3 + 2HCl \longrightarrow 2KCl + CO_2 + H_2O$)

(K = 39, C = 12, O = 16)

(ii) ඉහත a (i) හි ලබාගත් $K_2CO_3$ ස්කන්ධය 0.05 $mol\ dm^{-3}$ වැඩිපුර HCl ද්‍රාවණයක් සමග ප්‍රතික්‍රියා කළ විට පිටවන $CO_2$ මවුල සංඛ්‍යාව කොපමණද?

(b) (i) පහත සංයෝගවල IUPAC නම් ලියන්න.

I) $KH_2PO_4$ - II) $Fe_2S_3$ - III) $H_2O$ -

(ii) පහත සංයෝගවල සුළු නම ලියන්න.

I) CuCl - II) FeS - III) $FeC_2O_4$ -

(c) (i) ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ ශක්තිය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද?

(ii) ඉලෙක්ට්‍රෝන බන්ධුතාවය ලෙස හැඳින්වෙන්නේ කුමක්ද?

(iii) "$Cl(g) + e^- \longrightarrow Cl^-(g)\ \Delta E_{EG} = -349\ kJ\ mol^{-1}$ ලෙස සෘණ අගයක් වුවත්

$N(g) + e^- \longrightarrow N^-(g)\ \ \Delta E_{EG} = +134\ kJ\ mol^{-1}$ ලෙස ධන අගයක් පෙන්වයි."

ඉහත ප්‍රකාශයෙහි සත්‍ය අසත්‍ය බව සඳහන් කර හේතු පහදන්න.

(iv) Na, K, Rb, Cs යන මූලද්‍රව්‍ය ඉලෙක්ට්‍රෝන බන්ධුතාවයෙහි ධන අගය අවරෝහණය වන පිළිවෙළට සකසන්න.

08. (a) (i) ඔක්සිකරණය හා ඔක්සිහරණය යන පද අර්ථ දක්වන්න.

(ii) පහත සඳහන් ප්‍රභේදවල යටින් ඉරි ඇඳ ඇති පරමාණුවේ ඔක්සිකරණ අංකය ලියා දක්වන්න.

I) $K\underline{Mn}O_4$ II) $Na_2\underline{O_2}$ III) $H\underline{Cl}O_3$ IV) $\underline{N}H_4^+$

V) $Na\underline{H}$

(iii) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ($H_2O_2$) ද්‍රාවණයක සාන්ද්‍රණය පහසුවෙන් නිර්ණය සඳහා එය ආම්ලික මාධ්‍යයේදී සම්මත පොටෑසියම් පර්මැංගනේට් ($KMnO_4$) ද්‍රාවණයක් සමග අනුමාපනය කළ හැකිය.

($H_2O_2 \longrightarrow O_2$, $MnO_4^- \longrightarrow Mn^{2+}$)

(i) ඔක්සිකරණ අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

(ii) ඔක්සිහරණ අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

(iii) තුලිත රසායනික සමීකරණය ලියන්න.

(iv) $H_2O_2$ ද්‍රාවණයක 25.00 $cm^3$ ක් සමග සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කරවීමට 0.01652 mol $dm^{-3}$ $KMnO_4$ ද්‍රාවණයකින් 36.40 $cm^3$ වැය විය. $H_2O_2$ ද්‍රාවණයේ සාන්ද්‍රණය ගණනය කරන්න.

(b) (i) පහත වගුව ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන වගුවට පහළින් දී ඇති A, B හා C වර්ග යටතේ ඇති වචන පමණක් යොදා ගනිමින් වගුව සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | A<br>ද්‍රව්‍යය වර්ගය | B<br>ප්‍රාථමික අන්තර් ක්‍රියාව | C<br>ද්විතියික අන්තර් ක්‍රියාව |
|---|---|---|---|
| අයඩීන් | | | |
| මිනිරන් | | | |
| අයිස් | | | |
| NaCl(s) | | | |

A - අයනික දැලිස, නිර්ධ්‍රැවීය අණුක, ධ්‍රැවීය අණුක, යෝධ සහසංයුජ දැලිස

B - සහ සහසංයුජ බන්ධන, අයනික බන්ධන, ලෝහක බන්ධන

C - ලන්ඩන් බල, H බන්ධන, ස්ථිර ද්විධ්‍රැව - ස්ථිර ද්වි ධ්‍රැව, අයන - ස්ථිර ද්විධ්‍රැව

(ii) පහත වගන්තිය පහදන්න.

I) සාපේක්ෂ අණුක ස්කන්ධය ආසන්න වශයෙන් සමාන වන $CH_3F$ හි තාපාංකය -78°C වන අතර $CH_3OH$ හි තාපාංකය 65°C වේ.

II) $I_2$ වල ද්‍රාව්‍යතාව ජලය තුළ දීට වඩා KI තුළ ද්‍රාව්‍ය වේ.

(c) පහත සඳහන් සංයෝගවල විචලනය වැඩිවන ආකාරයට සකස් කර හේතුව පැහැදිලි කරන්න.

(i) $NO_2^+$, $NBr_3$, $NO_2Cl$, $HNO_3$ (N වල විද්‍යුත් සෘණතාවය)

(ii) $AlF_3$, $AlCl_3$, $AlBr_3$, $AlI_3$ (ජල ද්‍රාව්‍යතාව)

09. (a) (i) "පදාර්ථය" යන පදය හඳුන්වා එහි ප්‍රධාන අවස්ථා නම් කරන්න.

(ii) ඝන හා වායු සෑදී තිබෙන අංශුවල සකස් වීම සහ චලිතය පදනම් කරගනිමින් ඝන අවස්ථාව හා වායු අවස්ථාව අතර ඇති මූලික වෙනස්කම් 03 ක් ලබා දෙන්න.

(iii) පරිපූර්ණ වායු හා තාත්වික වායු අතර වෙනස්කම් 2 ක් සන්සන්දනය කරන්න.

(b) (i) ඇවගාඩ්රෝ නියමය සඳහන් කරන්න.

(ii) පරිපූර්ණ වායු නියම සමීකරණයෙන් ඇවගාඩ්රෝ නියමය අපෝහනය කරන්න.

(iii) පරිමාව 8.314 $dm^3$ වන සංවෘත දෘඪ බඳුනක $2.4 \times 10^5$ Pa පීඩනයක් යටතේ $Cl_2$ වායුව ද පරිමාව 4.157 $dm^3$ වන සංවෘත දෘඪ බඳුනක $1.6 \times 10^5$ Pa පීඩනයක් යටතේ $NH_3$ වායුව ද අන්තර්ගතව පවතී. මෙම භාජන දෙකම 127°C උෂ්ණත්වයේ පවතින අතර ඒවා සිහින් වීදුරු නලයක් මගින් රූප සටහනේ පරිදි එකිනෙක සම්බන්ධ කර ඇත.



CamScanner




I) කරාමය විවෘත කිරීමට පෙර එක් එක් භාජනයේ අඩංගු වායු මවුල සංඛ්‍යා වෙන වෙනම ගණනය කරන්න.

II) ඉහත භාජන දෙක සම්බන්ධිත කරාමය විවෘත කර වායු මිශ්‍ර වීමට ඉඩ හරින ලදී. එහිදී $NH_3$ හා $Cl_2$ පහත සමීකරණයට අනුව එකිනෙක සමග ප්‍රතික්‍රියා කරන ලදී.

$$NH_3(g) + 3Cl_2(g) \longrightarrow NCl_3(g) + 3HCl(g)$$

**A)** ප්‍රතික්‍රියාව සම්පූර්ණ වීමෙන් පසු බඳුන තුළ වූ මුළු මවුල ගණන සොයන්න.

**B)** ප්‍රතික්‍රියාව සම්පූර්ණ වීමෙන් පසු බඳුන තුළ වූ මුළු පීඩනය ගණන සොයන්න.



CamScanner